# දෙවන තේමාව - දේව වරප්‍රසාද ලබා දෙන සක්‍රමේන්තු

15

## 2.7. පැවිදි දිවිය තුළින් ජීවිතය දෙවි සමිඳුනට..

**පූජා ප්‍රසාදිවරු**

| පදවි පූජක | පැවිදි පූජක |
|---|---|
| රදගුරුතුමෙකුගේ නායකත්වය යටතේ ගිහියා සමඟ ජීවත් වෙමින් ඔවුන්ට සේවය කරමින් ඔවුන් සමඟ දේව රාජ්‍යය කරා ගමන් කිරීමට කැපවී සිටින පූජකවරය ලැබූ අය ය. | තෝරාගත් ශ්‍රේෂ්ඨයකු යටතේ නිශ්චිත ව්‍යවස්ථාවක් අනුගමනය කරමින් ස්වර්ගීක ජීවිතය මෙලොව අත් දකින හා ගත කරන පූජකවරය ලැබූ අය ය. |

- **පැවිදි නිකායකට අයත් සහෝදරවරුනට දිව්‍ය පූජාව සිදු කිරීමට නො හැකි මන් ද?**

ඔවුන් පැවිදි දිවියේ වේදහාර වන දිළිඳුකම, කීකරුකම හා ව්‍රත ශුද්ධිය දෙවිඳුන් ඉදිරියේ පොරොන්දු වුව ද පූජකවරය ලබා පූජක කාර්යභාර ඉටු කිරීමට වරය ලබා නැත. කන්‍යා සොයුරියෝ ද එලෙස ම දේව සේවයට කැප වී සිටිති.

ක්‍රිස්තුන් වහන්සේ ගේ ජීවිතය තුළින් ඉහත දැක්වූ වේදහාර ක්‍රියාත්මක වූ ආකාරය සුපුවත මගින් අපට හඳුනා ගත හැකි ය. උන්වහන්සේගේ ඒ ජීවිත සාක්ෂියෙන් ගලා ආ දේවරාජ්‍යයේ ආධ්‍යාත්මික වටිනාකම් පාදක කරගෙන සභා ඉතිහාසය තුළ තාපස ජීවිත ක්‍රමයක් ස්ථාපිත විය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## පැවිදි තාපස නිකායන්ගේ ආරම්භයඃ

මුල් කාලීන ව තපස්වරු ගෘහස්ථ ජීවිතයක් ගත කළත්, තුන් වන සිය වස පමණ වන විට සාමුහික ව ජීවත් වූ බවට සාක්ෂි ඇත. ආරණ්‍ය වාසී තපසුන් අතර පළමු වැන්නා ලෙස තීබිස් හි පාවුළුතුමා සැළකේ. එතුමාගේ ගෝලයකු වූ ශු. අන්තෝනිතුමාගේ (ක්‍රි.ව. 250 355) කාලයේ කාන්තාරබද ව තාපසයන් 5000 ක් පමණ සිටි බව සඳහන් වේ. පසු කලෙක තාපස ජනපද(ලව්රා) ක්‍රමය ඇති විය. තාපසයෝ තම ආධ්‍යාත්මික වර්ධනය සඳහා දැඩි දුෂ්කරතා විඳිමින් සාමූහික ජීවිත ක්‍රමයකට දායක වූහ.


තාපස ජීවිතය ක්‍රමවත් කරමින් ඊට මෙහෙවර කළ පුද්ගලයන් අතර ශු. බැසිල් තුමා, ශු. ජෙරම් තුමා, ශු. අගොස්තීනු තුමා හා ශු. අම්බ්‍රෝස් තුමා ගැන සඳහන් කළ හැකි ය. තාපස දිවියේ පුරෝගාමීන් ලෙස ශු. බෙනඩික් තුමා, ශු. පැකෝමියස් තුමා සැලකිය හැකි ය. විශේෂයෙන් තාපස පැවිදි ජීවිතයකට විනය මාලාවක් සකස් කළේ මෙතුමන්ලා ය.

**පැවිදි සොයුරු සොයුරියන්**
**ක්‍රිස්තුන් වහන්සේගේ සාක්ෂිකරුවන් ලෙසින් තිරසර,**
**බැහැපත් කැපවීමකින් යුතු ව**
**සියළු ජනතාව වෙනුවෙන් කරන සේවය උදාර ය.**

**ඔවුන් සිදු කරන මේ දූත කාර්යය,**
**තාපසාරාමයේ, පාසලේ හෝ රෝහලේ වේවා එය**
**ප්‍රශංසනීය මෙන් ම අගය කළ යුතු සේවාවකි.**

**(දෙවන වතිකාන කථීකාවතේ**
**"සභාව" පිළිබඳ ප්‍රකාශනය අංක 46 ඇසුරින්)**

පැවිදි ජීවිතය යනු කිතුනුවකු තම ප්‍රසාද ස්නාපනීය පොරොන්දුව වැඩි වගකීමකින් යුතුව පුළුල් ලෙස ඉටුකිරීමකි. පැවිදි තත්ත්වය යනු දේව කැඳවීමක් මෙන් ම විශේෂ දීමනාවක්ද වේ. ඔහු / ඇය වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද සුභාරංචිය ප්‍රකාශ කරන්නකු විය යුතු ය.




මෙම ජීවිත තත්ත්වයන් තුළ සියල්ලෝ ම එක හා සමාන වරප්‍රසාද ලබනු මිස (ප්‍රසාද ස්නාපනය තුළ) කිසිම පන්ති භේදයක් නොමැත. වේදහාර ලබා ගැනීම තුළ පැවිද්දෝ නව සමාජයකට අයත් වෙති. හවුල් ජීවිතය තුළ තම කැපවීම තහවුරු කර ගනිති. පොදු හවුල තුළ තම දුක සැප හා සතුට බෙදා ගනිමින් ඔවුන් සියලු දෙන සමීප අසල්වැසියන් ලෙස පිළිගෙන ඔවුන් සමග සාමයෙන් ජීවත් වෙති.

පැවිදි ජීවිතය තුළ මෙම පැතිකඩ තුන සමාන ය. දෙවෙනි වතිකාන කතිකාවට අනුව මූලික තැන දිය යුත්තේ,


1. සභාවට ය.
2. තම පැවිදි පංතියට ය.
3. පුද්ගලයාට ය.

- **සභාව** — **සභා ජීවිතයට නො පැකිලව සහභාගි විම.**
- **පැවිදි පංතිය** — **පැවිදි පංතියේ නිර්මාතෘවරයාණන්ගේ අධ්‍යාත්මික ගුණය ද එම පැවිදි පන්තියට උරුම වන විශේෂ අරමුණු හා සම්ප්‍රදායයන් ද උතුම් කොට සැලකීම.**


- **පුද්ගලයා** — උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරීම තුළින්, තමා පමණක් නොව, අන් අයව ද ශුද්ධවන්ත භාවය වෙත ගෙන යාම.

**තමා ජීවත් වන කාලයේ අවශ්‍යතාවන් අනුව හැඩ ගැසෙමින් දේව වචනයට වඩාත් ලැදි ව ජීවත් වීම ය.**

**සියලු ම පැවිදි පංතිවලට පොදු ධර්මගුණ හතරකි.**




මෙම ධර්මගුණ මගින් පැවිදි අය කිතු සමිඳුන් ලෙස තමා හිස් කිරීමටත් කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වීමටත් ජීවිත අත්දැකීම් ලබා ගනිති.



**පැවිදි දිවියට නිළ වශයෙන් ඇතුළත් වන්නේ වේදභාර ගැනීමෙනි.**

- **පැවිදි ජීවිතය තුළ තිබිය යුතු වෙනස්කම් :**

  - ඔවුන්ගේ ඇඳුම් චාම් ව හා මයහීදාවට අනුව සකස් විය යුතු ය.
  - කාලානුරූපී ව නිසි අධ්‍යාපනික පුහුණුවක් ලබා ගත යුතු ය.
  - තම නිකායික අපෝස්තලික සේවය තම ප්‍රදේශයේ සමාජීය පසුබිම අනුව සකස් කර ගත යුතු ය.

**ශ්‍රී ලංකාව තුළ පෘතුගීසී යුගයේ සේවය සඳහා පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම්:**

1. ප්‍රැන්සිස්කාන නිකාය
2. ජේසු නිකාය
3. දොමිනිකාන නිකාය
4. අගුස්තීන නිකාය

නම් වේ.

මෙම නිකායන්ට අමතර ව ලන්දේසි යුගයේ ක්‍රිස්තියානි පීඩන සමයේ ශ්‍රී ලංකාවේ කිතු දහම රැක ගැනීමට පුරෝගාමී ව කටයුතු කළේ ඔරතෝරියානු පියවරුයි. භාග්‍යවත් ජුසේවාස් පියතුමා අයත් මෙම ඔරතෝරියානු නිකායේ එතුමාගේ පැමිණීම හා සේවය කළ අද දක්වා ශ්‍රී ලංකාව තුළ කිතු දහම රැක ගැනීමට ඉවහල් විය.

ශ්‍රී ලංකාවට මෙම පැවිදි ධර්මදූතවරුන්ගේ සේවය ලැබීම නිසා ලංකාවේ අධ්‍යාපනික ආර්ථික හා සාමාජයීය සංස්කෘතික වෙනස්කම් රාශියක් ඇති විය.

- මිෂනාරි පාසැල් අධ්‍යාපනය ආරම්භ වීම
- රෝහල් සාත්තු සේවය ආරම්භ වීම
- දයා සේවා ආයතන බිහිවීම
- වැඩවසම් ක්‍රමය අහෝසිවීම සියලු දෙන සමානාත්මතාවයෙන් සැලකීම

වැනි වෙනස්කම් රාශියක් ඇති විය.

## අද ශ්‍රී ලංකාව තුළ සේවය කරන පැවිදි නිකායයන් මගින් සිදු වන විශේෂ සේවාඃ

### පැවිදි පූජක නිකායයන්

✿ **බෙනදිකාන නිකාය (OSB)**
අධ්‍යාපනය, මීසම් සේවය, දේව මහිමය හා සාමුහික ජීවිතය.

✿ **දිව්‍ය සත්ප්‍රසාද නිකාය (SSS)**
දිව්‍ය පූජාව සැබෑ අර්ථයකින් හා විවිධත්වයකින් යුතු ව ජනතාව වෙත ගෙන යාම, මීසම් සේවාව තුළින් කිතුනු පවුල ගොඩනැගීම, යාච්ඤාවේ හා වන්දනාවේ ජීවිතයක් තුළින් දෙවියන් වහන්සේට ප්‍රසන්න ජනතාවක් ගොඩනැගීම.

✿ **නිමල මරිය නිකාය (OMI)**
දිළිඳුන්ට සුවිශේෂය දේශනා කිරීම, ධර්ම විවේක, මීසම් සේවය, රෝහල් සේවය, භක්ති ප්‍රබෝධන සඟරාව, අධ්‍යාපනය, ළ. ක්‍රි. වි.

✿ **දොන් බොස්කෝ සැලේසියාන නිකාය (SDB)**
තරුණයින් සඳහා කරන විවිධ සේවාවන්.

✿ **පැ.තු.නි. ෆ්‍රැන්සිස්කාන නිකාය (TOR)**
මීසම් සේවය, අධ්‍යාපන සේවය, ධර්මෝපදේශ සේවය.

✿ **ජේසු නිකායික පියවරු (SJ)**
අධ්‍යාපන සේවය, මීසම් සේවය, සමාජ සේවා, ධර්ම විවේක.

✿ **දිව්‍ය ගැලවුම්කාරයාණන්ගේ නිකාය (CSsR)**
දේශනා කිරීම, මීසම් සේවය, ධර්ම විවේක.

✿ **ක්ලැරේසියාන නිකාය (CFM)**
දහම් සේවය, අධ්‍යාපනය, ධර්ම දානය, දේව වචනය ප්‍රකාශ කිරීම.

✿ **දොමිනිකන නිකාය (OP)**
අධ්‍යාපන සේවය, මීසම් සේවය, සමාජ සේවය.

✿ **ජපමාල නිකාය**
යාච්ඤාව, පශ්චත්තාපය, දිව්‍ය සත්ප්‍රසාදය කේන්ද්‍ර වූ තාපස දිවිය.

- **සොමස්කාන නිකාය**
  අනාථ වූ සහ අතහැර දමන ලද දරුවන් සඳහා සේවය.

- **වොලුන්ටාස් ඩේඊ (Voluntas Dei) පියවරු**
  ගිහි අධ්‍යාත්මික සේවය නඟා සිටුවීම, මීසම් සේවය.

## පැවිදි සොහොයුරන්ගේ නිකායයන්

- **සාන්ත ජෝන් බැප්ටිස්ට් ද ලා සාල් නිකාය**
  අධ්‍යාපන සේවය, තරුණ ජීවිත සඳහා විවිධ සේවාවන්.

- **මාරිස්ට් සහෝදර පැවිදි නිකාය**
  අධ්‍යාපන සේවය, තරුණයින් සඳහා ස්වයං රැකියා.

- **දයාවේ සහෝදරයෝ**
  අධ්‍යාපනය හා සමාජ සේවා.

- **ෆ්‍රැන්සිස්කාන මිෂනාරි සහෝදරයෝ**
  ධර්ම දානය සහ අනාථ නිවාස.

## පැවිදි සොහොයුරියන්ගේ නිකායයන්

- **ශුද්ධ වූ පවුලේ නිකාය (HF)**
  අධ්‍යාපන සේවය, ධර්මෝපදේශ සේවය, තරුණ, ළමා හා පවුල් සේවාවන්, මිෂනාරි සේවය, මීසම තුළ විවිධ සේවාවන්, පවුල ගොඩනැඟීම.

- **යහපත් එඬේරාගේ පැවිදි නිකාය (RGS)**
  තරුණියන් සඳහා විවිධ සේවාවන්, අනාථ දරුවන් හා මහළුවූවන් සඳහා සේවය, පාසල් අධ්‍යාපනය, මීසම් තුළ විවිධ සේවා.

- **මරියතුමියගේ ෆ්‍රැන්සිස්කාන ධර්මදූතික පැවිදි නිකාය (FMM)**
  අධ්‍යාපන සේවය, අනාථ දරු නිවාස, යාච්ඤාව, විවිධ සමාජ සේවා.

- **අපෝස්තලික කාර්මෙල් නිකාය (AC)**
  පාසල් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය, මීසම් සේවා, සමාජ සේවා.

✿ **සදා සරණ පැවිදි නිකාය (PH)**

අන්ධ, ගොළු, බිහිරි ළමයින්ගේ අධ්‍යාපනය, තරුණ තරුණියන්ට මග පෙන්වීම, අසරණයින්ට පිහිට වීම.

✿ **දිව්‍ය ගැළවුම්කාරයාණන්ගේ සහෝදරියෝ (Salvatorian)**

ධර්ම දානය, දිළිඳු, අසරණ, පීඩිත ජනතාවට පිහිට වීම, මීසම් සේවාවන්, අධ්‍යාපන සේවය.

✿ **සුරදූතික පැවිදි නිකාය (H.A)**

පාසල් සේවය, අනාථ දරු නිවාස, ළමා පරපුර හා තරුණියන් වෙනුවෙන් සේවාව.

✿ **දේවාරක්ෂාවේ පැවිදි නිකාය**

පාසල් අධ්‍යාපනය, ළදරු පාසල්, පවුල් සේවාව, තරුණ තරුණියන්ට සේවාව.

✿ **ෂැවනෝහි කුරුසියේ පැවිදි සොයුරියෝ**

පෙර පාසල් අධ්‍යාපනය වතුකරය හා නිදහස් වෙළඳ කලාපය තුළ සේවාව, දිළිඳුන්ට අතදීම හා නඟා සිටුවීම, ධර්මෝපදේශය.

✿ **සිරි කුරුස නිකාය**

සෞඛ්‍ය සේවය, වතුවල සේවය, ධර්මෝපදේශය, සමාජ සේවා.

✿ **දයාවේ සහෝදරියෝ**

අධ්‍යාපන සේවය, මහලු නිවාස, ධර්මෝපදේශය, ධර්ම දානය.

✿ **සියොනාවේ ශු. කතරිනා මුනිවරියන් පිළිපීන දොමිනිකානු නිකාය**

අධ්‍යාපන සේවය, ළදරු පාසල්, මීසම් සේවය, වතුකරයේ සේවාව.

✿ **මෝල්ටාවේ දොමිනිකානු නිකාය**

ධර්ම දානය, ධර්මෝපදේශය, ඉගැන්වීම, දිළිඳුන්ට සේවය.

✿ **දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ**

මහළු නිවාස දයා සේවය.

✿ **දයානුකම්පාවේ බෙනදිකාන සොහොයුරියෝ**

මහළු නිවාස හා විවිධ දයා සේවාවන්.

✿ **දයාවේ මිෂනාරි සහෝදරියෝ**
ඉතා දිළිඳු අය සඳහා සේවය.

✿ **කන්‍යා මරියතුමියගේ සහෝදරියෝ**
තරුණ තරුණියන් සඳහා සේවය, ධර්මෝපදේශය.

✿ **නිමල මරිය නිකාය**
අධ්‍යාපනය, ධර්මෝපදේශය, ධර්ම දානය.

**භාවනාශීලී සහ ගැඹුරු යාච්ඤාවට යොමු වූ තාපස නිකායයන්**

✿ **මහා කාර්මෙල් නිකාය**

✿ **දිළිඳු ක්ලාරා සොහොයුරියෝ**

✿ **බෙනදිකාන තාපසිකාවෝ**

✿ **ජපමාල අප ස්වාමිදූගේ දාසියන්ගේ නිකාය**

**පිළිතුරු ලියන්න.**

1. ඔබ මීසමේ හෝ පදවියේ හෝ සේවය කරන පැවිදි පංති තුනක් නම් කර, විස්තර සොයා සටහන් කරන්න.

2. එම පැවිදි පංතියන්ට අයත් නිළ කාර්යයන් ලියා දක්වන්න.

3. "තාපස ජීවිතය මෙලොව භාග්‍යවන්ත තත්ත්වයකි" යන මැයෙන් බිත්ති පුවත්පතකට වචන 250 පමණ ලිපියක් සකස් කරන්න.

**ඔබ අනුගමනය කරන්නේ කෙබඳු නායකයෙක් ද ?**

